# සමස්ත ලංකා පාසල්
# ළමා චිත්‍ර තරගය - 2011



**සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව.**
**අධ්‍යාපන අමාත්‍යාංශය.**
**"ඉසුරුපාය",**
**බත්තරමුල්ල.**

ඊඩී/1/1/1/5 - 2010 - 01
සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල ,
2010. 12. ០៨ දින

**චක්‍රලේඛ අංකය 2011/ ០២**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
චිත්‍ර විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
චිත්‍ර ගුරු උපදේශකවරුන් වෙත

## සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය හා ප්‍රදර්ශනය - 2011

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව මගින් වාර්ෂිකව පවත්වනු ලබන උක්ත තරගය හා ප්‍රදර්ශනය 2011 වර්ෂය සඳහා ද පැවැත්වීමට විධි විධාන යොදා ඇති බැවින්, ඒ පිළිබඳව ඔබ පළාතේ/ කලාපයේ සියලුම පාසල් වල විදුහල්පතිවරුන්, අදාළ ගුරුභවතුන් සහ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් දැනුවත් කරන මෙන් මෙයින් දන්වමි.

### හැඳින්වීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව 1984 වර්ෂයේ සිට ආරම්භ කරන ලද සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය දිවයිනේ සියලුම පාසල් කේන්ද්‍ර කර ගෙන අංශ 05 ක් යටතේ පවත්වනු ලබයි. ආදි මානවයාගේ සිට ආරම්භ වූ චිත්‍ර කලාව සමස්ත මානව ප්‍රජාවගේ සංවර්ධනය උදෙසා කරනු ලබන පුළුල් වූ මෙහෙවර වඩාත් අර්ථවත් කරනු වස්, පාසල් දරුවාගේ සිට තව දුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් මෙම තරගය ක්‍රියාත්මක වේ. පාසල් විෂය මාලාව ක්‍රියාකාරකම් පාදක කරගත් විෂය මාලාවක් බැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලීන් මේ ඔස්සේ සංවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. දරුවාගේ පෞරුෂ සංවර්ධනය උදෙසා පුළුල් වූ මෙහෙවරක් ඉටු කරනු ලබන චිත්‍ර කලාව සුසමාහිත ළමා මනසක් නිර්මාණය කරවීමට දායක වේ. වර්තමානයේ ළමා චිත්‍ර නිර්මාණ ලෝකයේ අග්‍රගණ්‍ය නිර්මාණ සේ සලකන බැවින් මෙම තරගය දරුවාගේ බුද්ධි සංවර්ධනය උදෙසාත්, කායික හා මානසික සංවර්ධනය උදෙසාත්, ඉමහත් මෙහෙවරක් ඉටු කරනු ලබයි. නව ක්‍රමෝපායන් තුළින් ජීවිතය වඩාත් අර්ථවත්ව ගත කිරීමට අවශ්‍ය පසුතලයක් නිර්මාණය කරන මෙම තරගය නිසා සමස්ත සමාජය යහපත් වූ පුරවැසියන් සහිත වූ සමාජයක් බවට පරිවර්තනය කිරීමට අවස්ථාව ලැබේ. මෙම තරගයෙන් ජයග්‍රහණය කරන සිසුන් විශ්ව විද්‍යාල වැනි උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමේ දී ප්‍රමුඛතාලාභී සිසුන් වශයෙන් ද සලකනු ලැබේ.

### අරමුණ

01. චිත්‍ර නිර්මාණය පිළිබඳ සුවිශේෂ දක්ෂතා දක්වන සියලුම ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ට ඒ සඳහා අවස්ථාවක් ලබා දීම සහ ඔවුන්ගේ කලා කුසලතා ප්‍රදර්ශනය සඳහා අවස්ථාව ලබා දීම.
02. සිසුන්ගේ නිර්මාණ පෞරුෂය පෝෂණය කිරීම.
03. වින්දනාත්මක ශක්තීන් වැඩි දියුණු කර පූර්ණ පෞරුෂයකට අවශ්‍ය මග සලසා දීම.
04. ප්‍රායෝගිකත්වයට හා තරගකාරීත්වයට වැඩි අවස්ථාවක් සලසා දීම.
05. ආත්මීය සංකල්ප පෝෂණය කිරීම.
06. ස්වයං ඇගයීමකට ලක් කරවීම තුළින් තම දක්ෂතා පිළිබඳව අභිමානයක් ගොඩ නගා ගැනීමට මං විවර කිරීම හා අන් කෘති රස වින්දනය කර උනුන් අතර අවබෝධය හා සහජීවනය වර්ධනය කරවීම.

# තරගය පිළිබඳ පොදු නීති රීති

## 01. තරගය

01. 01. මෙම තරගය අංශ 05 ක් (පහක්) යටතේ සංවිධානය කෙරේ.

| | | |
|---|---|---|
| 01. ප්‍රාථමික අංශය | - 01 සිට 02 ශ්‍රේණි දක්වා | (වයස අවුරුදු 05 - 06 ) |
| 02. පශ්චාත් ප්‍රාථමික අංශය | - 03 සිට 05 ශ්‍රේණි දක්වා | (වයස අවුරුදු 07 - 09 ) |
| 03. කනිෂ්ඨ අංශය | - 06 සිට 08 ශ්‍රේණි දක්වා | (වයස අවුරුදු 10 - 12 ) |
| 04. ජ්‍යෙෂ්ඨ අංශය | - 09 සිට 11 ශ්‍රේණි දක්වා | (වයස අවුරුදු 13 - 15 ) |
| 05. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය | - 12 සිට 13 ශ්‍රේණි දක්වා | (වයස අවුරුදු 16 - 18 ) |

01. 02. ඉහත සඳහන් වයස් කාණ්ඩ වලින් මෙම තරගය සඳහා සහභාගීවන සිසු/ සිසුවියන්ට පහත දැක්වෙන අංශ අතරින් එක් අංශයක් පමණක් තෝරාගත හැකිය. ඒ අනුව මෙම තරගයට ඉදිරිපත් කළහැක්කේ එක් සිසු/ සිසුවියෙකුට එක් නිර්මාණයක් පමණි.

**01. ප්‍රකාශන නිර්මාණයන්**
**02. කොලාජ් නිර්මාණයන්**
**03. මෝස්තර නිර්මාණයන්**
**04. ද්‍රව්‍ය බලා ඇඳීම**
**05. සාම්ප්‍රදායික චිත්‍ර**

## 02. සහභාගීත්වය

02. 01. රජයේ පාසල් වල සිසුන්ට හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද පෞද්ගලික පාසල් වල සිසුන්ටද, සියලු පිරිවෙන් විද්‍යායතන වල සිසුනට හා ශිෂ්‍ය හා ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාට ද, මෙම තරගයට ඉදිරිපත් විය හැකිය.

02. 02. තරගය සඳහා ඉදිරිපත් වන සියලුම ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් 2011. 01. 31 දින වන විට **වයස අවුරුදු 05 සම්පූර්ණ වී තිබිය යුතුය.**

## 03. තරගයට ඉදිරිපත් වීම

03. 01. තම අධ්‍යාපන කලාපයේ පාසල් මෙම තරගයට සහභාගී කරවීම ඒ ඒ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ද, කලාපීය චිත්‍ර කලා විෂය භාර අධ්‍යක්ෂ වරුන්ගේ ද, චිත්‍ර කලා ගුරු උපදේශකවරුන්ගේ ද, ඒ ඒ පාසල් වල විදුහල්පතිවරුන්ගේ ද වගකීම වේ

03. 02. මෙම තරගය සඳහා එක් ශිෂ්‍යයෙකුට/ ශිෂ්‍යාවකට ඉදිරිපත් කළ හැක්කේ **එක් නිර්මාණයක් පමණි.**

03. 03. සෑම නිර්මාණයක්ම අඟල් 18 × 14 ප්‍රමාණයේ එකක් විය යුතුයි

03. 04. පාසල් මට්ටමේ දී චිත්‍ර නිර්මාණය සඳහා ඕනෑම කඩදාසි වර්ගයක් යොදා ගත හැකි අතර වර්ණ කිරීම සඳහා පැස්ටල්, දිය සියම්, කුඩු සායම්, තෙල් සායම්, පෝස්ටර් සායම්, වැනි අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් ද යොදා ගත හැකිය.

03. 05. ජ්‍යෙෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන් තම නිර්මාණ වර්ණ කිරීම සඳහා දිය සායම් මාධ්‍ය භාවිත කිරීම වඩාත් සුදුසු ය.

03. 06. සෑම නිර්මාණයක්ම **2011 මාර්තු 31** දිනට පෙර තම පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලයේ චිත්‍ර කලා විෂය භාර අධ්‍යක්ෂ වරයාට හෝ කලාපීය අධ්‍යක්ෂ වෙත තැපෑලෙන් හෝ අතින් ගෙනවුත් භාර දිය යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන කිසිම චිත්‍ර නිර්මාණයක් භාර ගනු නොලැබේ.

03. 07. සෑම නිර්මාණයක්ම පිටු පස මේ සමග අමුණා ඇති අයදුම්පතට අනුව පිළියෙල කර ගත් අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර විදුහල්පති විසින් සහතික කිරීමෙන් අනතුරුව නොගැලවෙන සේ චිත්‍රය පිටු පස අලවා තිබිය යුතුය.

## 04. තරඟ අවස්ථා

04. 01. මෙම තරගය තරඟ අවස්ථා තුනකින් සමන්විත වේ.

**1. පළමුවන තරඟ අවස්ථාව - කලාප මට්ටම (අධ්‍යාපන කලාපයේ පාසල් අතර)**

**11. දෙවන තරඟ අවස්ථාව - පළාත් මට්ටම (පළාතේ කලාප අතර)**

**111. තෙවන අවස්ථාව - ජාතික මට්ටම (පළාත් අතර පැවැත්වෙන අවසන් මහා තරගය )**

### කලාප මට්ටම

04. 02. **2011 මාර්තු 31** දින හෝ ඊට පෙර තම අධ්‍යාපන කලාපයට අයත් පාසල් වල ශිෂ්‍ය, ශිෂ්‍යාවන්ගෙන් ලැබෙන සියලුම නිර්මාණ එකතු කර කලාපීය අධ්‍යාපන කාර්යාලයේ චිත්‍ර කලා විෂය භාර අධ්‍යක්ෂ, ගුරු උපදේශක ඇතුලු තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මගින් එම නිර්මාණ විනිශ්චයට ලක් කල යුතුය. මීට අතිරේකව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ අභිමතය මත පළාත් අධ්‍යාපන කාර්යාලයේ විෂය භාර අධ්‍යක්ෂවරයා ද අවශ්‍ය නම් සහභාගී කර ගත හැකිය.

04. 03. කලාපීය විනිශ්චයේ දී එක් අංශයකින් **හොඳම නිර්මාණ 25 බැගින් ඇතුලත් වන සේ හොඳම චිත්‍ර 125 ක් තෝරා අදාළ ජයග්‍රාහකයින්ගේ නාම ලේඛණය පිටපත් 02 කින් සකස් කර ඉන් එක් පිටපතක් අදාළ ජයග්‍රාහී නිර්මාණ සමග පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, අනික් පිටපත අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ලැබෙන සේ 2011 මැයි මස 15 දිනට පෙර එවිය යුතුය.**

04. 04. අදාළ කලාපීය ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර තිබීම අනිවාර්ය වේ.

04. 05. කලාපීය මට්ටමින් චිත්‍ර විනිශ්චය, අධීක්ෂණය කිරීමේ පූර්ණ වගකීම කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නියෝජිතයෙකු සතු වේ.

04. 06. කලාපීය තරග පැවැත්වීම සඳහා අවශ්‍ය **මූල්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ලබා ගත යුතුය.**

04. 07. කලාප තරගයේ සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ. මෙම චක්‍ර ලේඛයෙහි කොන්දේසි ඉක්මවා නොයන පරිදි, කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වන්නේ ද **කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාය.**

04. 08. කලාප තරග ප්‍රතිඵල ලේඛන කලාප තරග පවත්වා සතියක් ඇතුලත **ඒ ඒ පාසල් වලට අනිවාර්යයෙන්ම දන්වා යැවිය යුතුය.**

### පළාත් මට්ටම

04. 09. **2011 මැයි මස 15දින හෝ ඊට පෙර** තම බල ප්‍රදේශයට අයත් කලාප කාර්යාල වලින් ලැබෙන චිත්‍ර නිර්මාණ හා අදාළ ප්‍රතිඵල ලේඛන එකිනෙකට සමාන බවට සහතික කර ගත යුතුය.

04. 10. පළාත් මට්ටමේ චිත්‍ර තරගය සංවිධානය කොට පැවැත්වීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ උපදෙස් මත පළාත් දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය අධ්‍යක්ෂ හෝ චිත්‍ර කලා නි. අ. අ./ ස. අ. අ. විසින් කළ යුතුය.

04. 11. පළාත් තරගයේ දී කලාපීය මට්ටමෙන් ජයග්‍රහණය කරන ලද සිසුන් එක් මධ්‍යස්ථානයකට කැඳවා චිත්‍ර ඇන්දවීම සිදු කළ යුතුය. පළාත් මට්ටමින් චිත්‍ර ඇන්දවීමේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු අධීක්ෂණය සඳහා පැමිණෙනු ඇත.

04. 12. **සියලුම පළාත් තරග 2011 ජූනි මස 30 දිනට පෙර පවත්වා අවසන් කළ යුතුය.**

04. 13. චිත්‍ර ඇන්දවීම සඳහා සුදුසු මධ්‍යස්ථානයක් තෝරා ගැනීමේ දී, එය **සියලුම සිසු සිසුවියන්ට වඩාත් පහසු ලෙස පැමිණිය හැකි ස්ථානයක් විය යුතු වීම ඉතා වැදගත්ය.**

04. 14. පළාත් මට්ටමින් චිත්‍ර ඇන්දවීමේ දී අදාළ ශිෂ්‍යාට/ ශිෂ්‍යාවට වඩාත් පහසුදායක අන්දමින් තම නිර්මාණය නිම කිරීමට අවශ්‍ය පහසුකම් සපුරා දිය යුතු අතර, එහි දී පළාත් දෙපාර්තමේන්තුවේ සෞන්දර්ය අධ්‍යක්ෂ හෝ චිත්‍ර කලා නි. අ. අ./ ස. අ. අ. පූර්ණ කාලීනව වග විය යුතුය.

04. 15. අවශ්‍ය සහායයන් තම අධ්‍යාපන බල ප්‍රදේශයට අයත් කලාප අධ්‍යාපන කාර්යාල වල චිත්‍ර කලා අධ්‍යාපන නිලධාරීන්ගෙන්, ගුරු උපදේශකවරුන්ගෙන් ලබා ගත යුතුය.

04. 16. චිත්‍ර ඇන්දවීම සඳහා සිසුන් සහභාගී කරවීමේ දී, අදාළ **ශිෂ්‍යයාට, ශිෂ්‍යාවට තෝරාගත් අංශය යටතේ තමා කැමති මාතෘකාවක් ඔස්සේ චිත්‍රය ඇඳීමට අවකාශය ලබා දිය යුතු අතර, ඒ සඳහා පෙ. ව. 09. 00 සිට ප. ව. 04. 30 දක්වා කාලය ලබා දිය යුතුය.**

04. 17. සිසු සිසුවියන් ලවා චිත්‍ර ඇන්දවීමේදී ඒ සඳහා **අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන මුද්‍රිත කඩදාසි පමණක් යොදා ගත යුතුය.**

4. 18. සිසු සිසුවියන් ලවා චිත්‍ර ඇන්දවීමේදී අදාළ ශාලාවන් තුළට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පත් කරනු ලබන නිලධාරීන් හැර වෙනත් කිසිදු පුද්ගලයකු ඇතුළත් නොකළ යුතුය.

04. 19. සිසු සිසුවියන් ලවා චිත්‍ර ඇන්දවීමේදී කුමන හේතුවක් නිසාවත් අදාළ සිසු සිසුවියන්ට චිත්‍ර ඇඳීම සඳහා ගුරු භවතුන්ගේ හෝ දෙමව්පියන්ගේ සහාය ලබා නොදිය යුතුය. ඒ සඳහා බලපෑම් නොකළ යුතුය.

04. 20. සිසු සිසුවියන් විසින් චිත්‍ර ඇඳ අවසාන වූ පසු ඒවා වඩාත් ආරක්ෂිත අයුරින් එකතු කොට **එදිනම හෝ ඊට පසු දිනම විනිශ්චයට ලක් කළ යුතුය.**

04. 21. පළාත් විනිශ්චය මණ්ඩලය පළාතේ සෞන්දර්ය විෂය භාර අධ්‍යක්ෂ වරුන්ගේ හෝ චිත්‍ර කලා ගුරු උපදේශක වරුන්ගේ නිර්දේශය මත තෝරා ගත් ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් විය යුතුය. (පළාත් විනිශ්චය මණ්ඩලය අවම වශයෙන් තිදෙනෙකුගෙන්වත් සමන්විය යුතුය.)

04. 22. පළාත් විනිශ්චය මණ්ඩලය මගින් එක් අංශයකින් **හොඳම නිර්මාණ 50 ක් බැගින් චිත්‍ර 250 ක් තෝරා ගත යුතුය.**

04. 23. පළාත් විනිශ්චය මණ්ඩලය මගින් තෝරා ගත් **චිත්‍ර නිර්මාණ 250 ත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනයත් 2011 ජූලි මස 15 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත ගෙනැවිත් භාර දිය යුතුය.**

04. 24. පළාත් ප්‍රතිඵලයන් ඒ ඒ ජයග්‍රාහී සිසු සිසුවියන්ට ද දන්වා යැවිය යුතු අතර, චිත්‍ර නිර්මාණ අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දීමේදී රෝල් නොකර භාර දිය යුතුය.

**ජාතික මට්ටම**

04. 25. පළාත් වලින් ලැබෙන සියලුම ජයග්‍රාහී නිර්මාණ එකතු කර ජාතික මට්ටමින් තෝරා ගත් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චය කෙරේ.

**05. සහතික පත්‍ර ප්‍රදානය සහ ප්‍රතිපෝෂණය**

05. 01. **කලාප හා පළාත් මට්ටමේ තරග වලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරිනැමීම කලාප හා පළාත් මට්ටමින් කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පරිනමනු ලැබේ.**

05. 02. ජාතික විනිශ්චයේදී සෑම තරග අංශයකින්ම **ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන වශයෙන් ස්ථාන 15 ක් ද, අනුස්මරණ ස්ථාන 05 බැගින් ස්ථාන 25 ක් ද, විශිෂ්ඨ සම්මාන 20 බැගින් 100 ක් ද, සම්මාන ස්ථාන 13 බැගින් ස්ථාන 65 ක් ද වන සේ සහතික ලාභීන් තෝරා ගැනේ. ඊට අතිරේකව සෑම අංශයකින්ම කුසලතා සහතික ලාභීන් 125 බැගින් තෝරා ගැනේ.**

05. 03. **ජයග්‍රාහක සිසුන්ගේ නිර්මාණ කෘති ඇතුලත් ප්‍රදර්ශනය හා සහතික පත් ප්‍රදානෝත්සවය 2011 සැප්තැම්බර් මස අවසන් සතියේදී පැවැත්වේ.**

05. 04. තරගයට සහභාගී වූ සිසුන්ගේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය සහ සංවර්ධනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන විවිධ වැඩ සටහන් උපයෝගී කර ගනු ලැබේ.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලු ම තරග කරුවන් හා සම්බන්ධවන අනෙකුත් පාර්ශව කරුවන් තරගයේ සෑම අවස්ථාවකදී ම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් සියලුම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වශයෙන් පිළි ගැනීමටත්, එකග විය යුතුය.

මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත්, තරගයේ කුමන අවස්ථාවක දී වුවද ප්‍රතිඵල ලේඛන වලින් එම විද්‍යුහල ඉවත් කිරීම, විනයානුකුල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

**එච්. එම්. ගුණසේකර**
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
2010. 12. 08

**සිසුන් සඳහා ආදර්ශ අයදුම් පත්‍රය**

## සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය - 2011

01. ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ නම - ........................................................................................
(මුලකුරු ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින් සඳහන් කරන්න.)

02. පාසල හා ලිපිනය - ........................................................................................
දුරකථන අංකය - ........................................................................................

03. පෞද්ගලික ලිපිනය - ........................................................................................
දුරකථන අංකය - ........................................................................................

04. පළාත - ........................................................................................

05. අධ්‍යාපන කලාපය - ........................................................................................

06. ඉදිරිපත් වන අංශය - ........................................................................................

07. ඉගෙනුම ලබන ශ්‍රේණිය - ........................................................................................

08. චිත්‍ර කලා ගුරුභවතාගේ නම- ........................................................................................

දිනය - ..........................................     ශිෂ්‍යාගේ/ ශිෂ්‍යාවගේ අත්සන - ..............................

---

**විදුහල්පතිගේ නිර්දේශය -**

පිටුපස සඳහන් නිර්මාණය මෙම ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ බවත්ද අයදුම්පතෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

..............................................     ..............................................

විදුහල්පතිගේ නම     විදුහල්පතිගේ අත්සන

..............................................     ..............................................

දිනය     නිල මුද්‍රාව

මුද්‍රණය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව